# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 907/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 29/05/2024<br>පැය 1640 | | |

## මාධ්‍ය නිවේදනය

### ආචාර්ය පුන්සර අමරසිංහ මහතා අත්අඩංගුවට ගැනීම - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු දිසාව

රූපවාහිණී නාලිකාවක් වෙත 2024.05.25 වන දින සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් කරන ලද ප්‍රකාශ කිහිපයක් සම්බන්ධයෙන් ආචාර්ය පුන්සර අමරසිංහ යන අය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ උපදෙස් පරිදි ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් විමර්ශනයක් පවත්වා අත්අඩංගුවට ගෙන ඇත.

ඔහු විසින් එම සම්මුඛ සාකච්ඡාවේදී පාස්කු ප්‍රහාරය විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද වාර්තාවේ අන්තවාදයට නැඹුරු වුන රැඩිකල් වූ පුද්ගලයින් 300 ක් 400ක් අතරින් ඉන්දියාවේදී අත්අඩංගුවට ගත් ශ්‍රී ලාංකික පුද්ගලයින් සිව් දෙනාගේ නම් ඇතුලත්ව තිබූ බවත් රජයේ හෝ ආරක්ෂක අංශ එම පුද්ගලයින් පිළිබඳව සමීප අධීක්ෂණයක් තබා නොගත් බවත් ප්‍රකාශ කර තිබූ අතර එම ප්‍රකාශය සිදු කළේ කුමන තොරතුරු මතද යන්න විමසීමේදී එය වැරදීමකින් සිදු කරන ලද ප්‍රකාශයක් බවත් ඒ පිළිබඳව කණගාටු වන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත.

එම පුද්ගලයා විසින් උක්ත මාධ්‍ය සාකච්ඡාවේදී ඉස්ලාමීය මද්‍රසා පාසල් වල උගන්වන පෙළපොත්වල මූලධර්මවාදීන් වැරදි ලෙස අර්ථකථනය කර ඇති බැවින් 2020 වර්ෂයේදී ඒවා තහනම් කළ බවත් 2023 වර්ෂයේදී එම තහනම ඉවත් කර ඇති බවත් ප්‍රකාශ කර තිබූ අතර එම ප්‍රකාශයද තහනම ඉවත් කර නොමැති බවට කරුණු නොදැන ප්‍රමාද දෝෂයකින් සිදු කරන ලද ප්‍රකාශයක් බවත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත

එමෙන්ම සකීර් හුසේන් සහ පී.ජේ. යනුවෙන් හඳුන්වන මූලධර්මවාදීන් විසින් ශ්‍රී ලංකා මද්‍රසා පාසල් වල ඇති පෙළපොත් වල කුරාණයේ අර්ථයට වැරදි අර්ථකථන දී ඇති බව සඳහන් කර තිබෙන අතර ඒ පිළිබඳව විමසීමේදී නිශ්චිතව යමක් පැවසීමට නොදන්නා බවත් මෙය

ප්‍රමාද දෝෂයකින් සිදු කරන ලද ප්‍රකාශයක් බවට සඳහන් කර ඇත. එසේම ආදිල් X නැමැති පුද්ගලයකු 2019 වර්ෂයේදී අත්අඩංගුවට ගැනීමෙන් පසු එම පුද්ගලයා නිදොස්කොට නිදහස් කර ඇති බවට ප්‍රකාශ කර ඇති අතර එයද අනවබෝධයෙන් සිදු කරන ලද ප්‍රකාශයක් බව ඔහු විසින් පිළිගෙන ඇති අතර එම පුද්ගලයාට විරුද්ධව මේ වන විටත් ගාල්ල මහාධිකරණයේ නඩු විභාග වන බව නොදන්නා බවද දැනුම් දී ඇත.

ඉහත පරිදි ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සම්බන්ධයෙන් මෙන්ම ජාත්‍යන්තරව වැදගත් වන කාරණයන් සම්බන්ධව හා විවිධ ජාතීන්ට බලපාන සංවේදී වූ කාරණයන් පිළිබඳව වගකීම් විරහිතව මහජනතාව වෙත තොරතුරු ඉදිරිපත් කර තිබෙන බව නිරීක්ෂණය වේ. ඔහුගෙන් විමසීමේදී ඉහත ආකාරයට තොරතුරු ඉදිරිපත් කිරිම නිසා පසුව, ඔහුගේ ප්‍රකාශයක් සටහන් කර ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ සහ පොලිස් ආඥා පනතේ සඳහන් වැරදි වලට අදාලව මෙම සැකකරු 2024.05.28 වන දින අත්අඩංගුවට ගත් බව ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසයේ ස්ථානාධිපතිවරයා විසින් මා වෙත වාර්ථා කර ඇත.

සැකකරු වයස අවුරුදු 34 ක් වන පැලවත්ත බත්තරමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

මෙම සැකකරු 2024.05.29 වන අද දින කොටුව ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රුපියල් ලක්ෂ 10 ක ශරීර ඇප මත මුදා හරින ලදි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**